# පානදුර නගරසභා ගොඩනැගිල්ලේ බ්‍රිතාන්‍ය වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

**පෙරේරා එස්.එන්.සී.**[1]

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ දී ශ්‍රී ලංකාවේ ඉදි වූ බොහෝ ගොඩනැගිලි සමකාලීන බ්‍රිතාන්‍ය වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අනුව ඉදිකර තිබීම විශේෂ ලක්ෂණයක් ලෙස දැකිය හැකිය. ඒ අනුව විවිධ පොදු සේවා ආශ්‍රිත ගොඩනැගිලි හා පරිපාලනය සම්බන්ධ ගොඩනැගිලි ඒ අතරින් ප්‍රමුඛ ස්ථානයක් දරයි. එවන් බ්‍රිතාන්‍ය වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැගිල්ලක් ලෙස පානදුර නගර සභා ගොඩනැගිල්ල හඳුන්වාදිය හැකිය. එම ගොඩනැගිල්ලේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව විමර්ශනයක් කිරීම මෙම පත්‍රිකාවෙහි අරමුණ වේ. 20 වැනි සියවසේ මුල් භාගයේ දී ඉදි වූ මෙම ගොඩනැගිලි කෙරෙහි බ්‍රිතාන්‍ය වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ බලපා ඇත්තේ කෙසේ ද? යන්න පිළිබඳ පර්යේෂණ ගැටළුව මූලික කොට ගෙන පානදුර නගර සභා ගොඩනැගිල්ල මෙහි දී අධ්‍යයනයට ලක් කෙරේ. මේ සඳහා මුළුමනින්ම ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීම පාදක කර ගන්නා ලදී. ක්‍රි.ව. 1925 දී එවකට රජයේ පරිපාලන නිලධාරි ධූරය හෙබවූ සෙසිල් ක්ලෙමන්ට් විසින් මෙම ගොඩනැගිල්ලට මුල්ගල තැබූ අතර ම ඉන් අනතුරු ව ක්‍රි.ව. 1927 දී සර්. හර්බට් ස්ටැන්ලි ආණ්ඩුකාරවරයා විසින් මෙම ගොඩනැගිල්ල විවෘත කොට තිබේ. සී. ඩොමින්ගෝ ඩයස් මහතා සිහිවීම පිණිස ඉදිකර ඇති මෙම ඉදිකිරීම ඔහුගේ නමින් ම නම් කොට තිබේ. මහල් දෙකකින් යුත් මෙහි ඉදි කිරීම් සඳහා ග්‍රීක, රෝම වාස්තුවිද්‍යාත්මක ලක්ෂණවලින් පෝෂිත වූ බ්‍රිතාන්‍ය වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ ද මනා ලෙස සංකලනය කොට උපයෝගී කරගෙන තිබේ. ටස්කන් (Tuskan) සම්ප්‍රදායේ කුලුණු යුග්මයක් සහිත පෝටිකෝව යුරෝපීය ලියකම් සැරසිලි (Festions), ආරුක්කු හැඩයේ කවුළු මෙන් ම විසිතුරු මුදුනටි (Facade) බැලූ බැල්මට ම සමකාලීන කිතුනු දේවස්ථානයක මුහුණුවරක් විද්‍යමාන කරයි. 20 වන සියවසේ දෙවන දශකය තුළ දී ප්‍රචලිත ව ගිය, එතෙක් භාවිතයේ පැවති වික්ටෝරියා වාස්තුවිද්‍යා සම්ප්‍රදායට වඩාත් මඳ සමානත්වයක් දරන්නා වූ මෙම ලක්ෂණය සමකාලීන දුම්රිය ස්ථාන ඇසුරෙන් ද දැකගත හැකිය. ඒ අනුව එවැනි ස්මාරක අගයකින් (monumental value) යුක්ත ය. පානදුර ප්‍රදේශයේ ඉදිකර ඇති මෙම නගර සභා ගොඩනැගිල්ල ලංකාවේ බ්‍රිතාන්‍ය වාස්තුවිද්‍යාවේ තවත් සම්ප්‍රදායක් නිරූපණය කරන ගොඩනැගිල්ලක් ලෙස පෙන්වා දිය හැකිය.

**මුඛ්‍ය පද :** පානදුර නගර ශාලාව, බ්‍රිතාන්‍ය වාස්තුවිද්‍යාව, බ්‍රිතාන්‍ය යුගයට අයත් ස්මාරක, ටස්කන් සම්ප්‍රදාය, ග්‍රීක රෝම වාස්තුවිද්‍යා සම්ප්‍රදාය

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.
nirodhachandramali1@gmail.com